# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/8/1/62-II | ඔබේ අංකය<br>உனது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2023.02.09 |
|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (අයවැය) 02/2023

සියළුම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්,

ගණන් දීමේ නිලධාරීන්,

ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,

දකුණු පළාත.

<u>වියදම් පාලනය</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මුදල්, ආර්ථික, ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද අංක BD/CBP/01/01/05/2022 හා 2023.02.02 දිනැති අයවැය චක්‍රලේඛ අංක 02/2023 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02.පවතින අයහපත් හා අනපේක්ෂිත ආර්ථික තත්වය තුල රාජ්‍ය මුල්‍ය කළමණාකරණය සම්බන්ධයෙන් මතුව ඇති දැඩි දුෂ්කරතා පිලිබඳව මේ දක්වා නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ හා ප්‍රධාන ලේකම් චක්‍රලේඛ මගින් ඔබව දැනුවත් කර ඇති අතර විශේෂයෙන් මෑතකදි මුදල් අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති අංක 01/2023 හා අංක 9/2022 දරණ අයවැය චක්‍රලේඛ හා ප්‍රධාන ලේකම් චක්‍රලේඛ අංක 1/2023 යන චක්‍රලේඛ මගින් එම දුෂ්කරතා මඟහරවා ගැනිමට ගතයුතු පියවර පිළිබඳව දැනටමත් ඔබගේ අවධානය යොමු කර ඇත.

03. මෑතකදි කරන ලද බදු සංශෝධනය තුලින් රජයේ අපේක්ෂිත ආදායම් ඉලක්ක සපුරාගන්නා තෙක් අත්‍යාවශ්‍යම රාජ්‍ය සේවා බාධාවකින් තොරව පවත්වාගෙන යාමට පමණක් අත් මුදල් නිදහස් කිරිමට අංක 23/0201/604/018 හා 2023.01.30 දිනැති අමාත්‍ය මන්ඩල තීරණය මගින් උපදෙස් ලැබී ඇත. ඒ අනුව වැටුප්, විශ්‍රාම වැටුප්, සුභසාධන වියදම්, වෛද්‍ය සැපයීම් සහ ඉහත අයවැය චක්‍රලේඛ මගින් ප්‍රමුඛතාගත කර ඇති අත්‍යාවශ්‍ය වියදම් සඳහා පමණක් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් අත් මුදල් නිදහස් කරනු ලබන බැවින්, පළාත් සභාව විසින්ද අත්‍යාවශ්‍ය වියදම් සඳහා පමණක් අත් මුදල් නිදහස් කිරිමට කටයුතු කරනු ලැබේ. එබැවින්, ඉහත කොන්දේසිවලට පටහැනිව බැදීම් ඇතිකර නොගත යුතු අතර එවැනි බැදීම් සම්බන්ධයෙන් අදාල නිලධාරින් පුද්ගලිකව වගකිව යුතු බවද අමාත්‍ය මණ්ඩල තීරණය තුලින් අවධාරණය කර ඇත.

04. ඒ අනුව, අත්‍යාවශ්‍ය හා හදිසි මහජන සේවාවන් පවත්වාගෙන යාමට අවශ්‍ය සේවාවන් ලබා ගැනීම සඳහා පමණක් පළාත් සභා ආයතනවලට ප්‍රතිපාදන පැවරීම කළ යුතු අතර වෙනත් කටයුතු සඳහා ප්‍රතිපාදන පැවරීම් කර එම සේවා ලබා ගැනීමෙන් පසුව අදාල වියදම් පියවා ගැනීමට භාණ්ඩාගාරයෙන් අත් මුදල් ඉල්ලුම් කිරිම නොකළ යුතුය. එසේම කල් දැමිය නොහැකි අත්‍යාවශ්‍ය මහජන සේවා පවත්වා ගැනිම සඳහා පෞද්ගලික හෝ රාජ්‍ය ආයතන සමග දැනටමත් බැඳීම් ඇතිකරගෙන ඇති සේවාවන් සම්බන්ධයෙන් සහ එදිනෙදා අත්‍යාවශ්‍ය රාජකාරි කටයුතු සඳහා ණය පදනම මත සේවා ලබා ගැනීම සම්බන්ධයෙන් මෙමගින් බාධාවක් ඇති නොවිය යුතුයි.

05. මේ සම්බන්ධයෙන් ඔබගේ විෂය පථයට අයත් සියලු ආයතනවල අදාල නිලධාරින් දැනුවත් කිරිමට හා මෙම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුගතව කටයුතු කරන බවට තහවුරු කර ගැනිමට ඉහත අමාත්‍ය මන්ඩල තීරණය අනුව ඔබගේ වගකීමක් බව කාරුණිකව දැනුම් දෙමි.

සුමිත් අලහකෝන්,

ප්‍රධාන ලේකම්,

දකුණු පළාත.

පිටපත් :-

| | | | |
|---|---|---|---|
| 1. | ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, දකුණු පළාත | - | දැ.ගැ.ස. |
| 2. | ලේකම්, මුදල් කොමිෂන් සභාව | - | දැ.ගැ.ස. |
| 3. | අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත | - | අ.ක.ස. |
| 4. | ගිණුම් සහ ගෙවීම් අධ්‍යක්ෂ, දකුණු පළාත | - | අ.ක.ස. |
| 5. | මුදල් අධ්‍යක්ෂ, දකුණු පළාත | - | අ.ක.ස. |


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office: 091 4119011, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax: 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site: www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.

பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"සෞභාග්‍යමත් දකුණු පළාතක්"